**වාවකච්චේරි ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 24 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 31 දිනද සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වාවකච්චේරි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**---------------------------------------------**

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**-------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල පිළියෙල කිරීමට යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |

(ආ) **ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වාහන 05ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත නොකිරීමෙන් මෝටර් රථවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | කමිටු ස්ථාපිත කර වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කර ඇත. | වාහනවල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විවිධ ඉඩම් හා ගොඩනැගිලි 15ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් නොකිරීමෙන් දේපළ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුවේ. |
| (ඇ) | රු.8,830,000ක් වටිනා වෙළෙඳ පොල 5ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් නොකිරීමෙන් ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | වෙළෙඳපොල වටිනාකම ඉදිරි කාලයේදී එකතු කරනු ලැබේ. | වෙළෙඳපොල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුවේ. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදි මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරනු ලැබේ. | වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ආ) | 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනත 158(1) වගන්තිය | හිඟ වරිපනම් බදු රු. 2,545,710 ක් ගෙවීම පැහැර හැරී පුද්ගලයන්ට වරෙන්තු නිකුත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ වරෙන්තු නිවේදන නිකුත් කෙරේ. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව නියමිත ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය 2018.01.24 දිනැති අංක 02/2018 | සේවකයින්ට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට අඩුනොවන පුහුණුවක් ලබාදුන් බවට තහවුරු කළ නොහැකිව පැවැතුණි. | පුහුණුවීම් ලබාදීමට කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව සේවකයින් පුහුණුව ලබාදීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | අනෙකුත් චක්‍රලේඛ 2018.07.19 දිනැති අංක 2018/e පළාත්පාලන -01 දරන චක්‍රලේඛය | ප්‍රජාවට අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් ලබාගැනීමේ පහසුකම් සලසා දී නොතිබුණි. | ගෞරව ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා සේවාවන් සැපයීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අදාල ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වුවත් සභාව විසින් ඒවා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අප ප්‍රාදේශීය සභාවට අදාල ඉඩම් විකුණුම් මත බදු 1% ක් සභාවට ලබාගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවති. | දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට උචිත ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,168,509 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 32,663,917 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,568,317 | 161,994 | 3,313,013 | 106,000 | 24,731 | 484,156 |
| කුලී | 16,563,200 | 15,249,649 | 103,454 | 13,679,907 | 14,903,808 | 113,004 |
| බලපත්‍ර ගාස්තු | 1,476,100 | 3,428,164 | 5,850 | 739,050 | 1,950,111 | 5,850 |
| වෙනත් ආදායම් | 74,190,648 | 78,437,100 | - | 74,467,943 | 71,580,662 | - |
| | 94,798,265 | 97,276,907 | 3,422,317 | 88,992,900 | 88,459,312 | 603,010 |

**2.2.2 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිඟ දේපල බදු රු.2,545,710 ක් අයකර ගැනීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකරමින් පවති. | හිඟ දේපල බදු අයකර ගැනීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | හිඟ අක්කර බදු රු.57,086 ක් අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සම්බන්ධිත ලේඛන යුධ කාලපරිච්ඡේදයේදි විනාශ වි ගිය බැවින් කපාහැරිය නොහැකි විය. | හිඟ අක්කර බදු අයකර ගැනීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**2.2.3 උසාවි දඩ මුදල්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු. 5,905,950 ක් ලැබිය යුතුව තිබුණි. | උසාවි දඩ මුදල් මේ දක්වා පළාත් භාණ්ඩාගාරයට ලැබී නොතිබුණි. | උසාවි දඩ මුදල් අයකර ගැනීමට උචිත ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය, මහජන උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලුම කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍ය ජනතාවගේ සුබවිහරණය, පහසුකම් හා සුහසාධනය සහ ආරක්ෂාව පිළිබඳව හෙළිවූ කරුණු පහත සඳහන් පරිදි විය.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කළ යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් මූලික කරුණු 25ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කර තිබුණි. | මූලික කරුණු 25ක් සඳහා අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ පල කර ඇත. | පනතට අනුකූලව සුදුසු අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 25ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරනු ලැබේ. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ රු. 160,389ක් වැයකර තිබුණත් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි. | සභාවේ ට්‍රැක්ටරයක ලෝඩ් එකක කසල සඳහා රු. 2,000 බැගින් අයකිරීමට තීරණය කර ඇත. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ප්‍රකාරව උචිත ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමැතියකින් තොරව ඉදිකර තිබූ විදුලි සංදේශ කුළුණු 08ක් සඳහා ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හමුදා කඳවුරු ඇතුළත පිහිටි නිසාත් ඉඩම්හිමියන් සමග නඩු විභාග වෙමින් පවතින බැවිනුත් අනුමැතිය ලබාගැනීමේ දුෂ්කරතාවයන් පවතී. | ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අදාල කාලය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | රු.1,381,550ක අත්තිකාරම් දෙකක් නිරවුල් නොකර වර්ෂයකට අධික කාලයක සිට සභාවේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවතුණි. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | අත්තිකාරම් නිරවුල් කිරීමට නියමිත ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඇ) | පසුගිය වසර 10කට අධික කාලයක සිට දේපළ සඳහා වූ නැවත තක්සේරුවක් සිදුකර නොතිබුණි. | අවසන් කළ ලැයිස්තු අදාල පාර්තමේන්තුවෙන් මේ දක්වා ලැබී නොතිබුණි. | දේපළ සඳහා වූ නැවත තක්සේරුවක් සිදු කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් නියමිත පදිරි මානව සම්පත් ලබාගෙන යෙදවීම සිදුකර නොතිබු බැවින්, එවැනි මානව සම්පත් 16 ක් විසින් නිම කළයුතු කාර්යයන් ප්‍රමාද වී තිබු බව විගණනයේදි නිරීක්ෂණය විය. | ලැයිස්තුගත නොකළ කාරය මණ්ඩලයේ ස්ථිර පත්වීම් සඳහා කළමනාකරණ සේවා දේපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යවා ඇත. | තනතුරු පුරප්පාඩු නියමිත කාලය තුළ පිරවීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දේපළ හිමියන් 2,725දෙනෙකුට "K" ආකෘති පත්‍ර නිකුත් කර නොතිබුණි | "K" ආකෘති පත්‍ර නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | පනතට අනුව "K" ආකෘති පත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතුවේ. |
| (ආ) ව්‍යාපාරික අවසර බලපත්‍රයක් නොමැතිව ජනතා මණ්ඩපයක් පැවැත්වීම සම්බන්ධයෙන් නඩුවක් විභාග වෙමින් පවතින නමුත් මේ සඳහා වූ අපේක්ෂිත බැරකම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් ලෙස ඉදිරි කාලයේදි මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලැබේ. | නඩු සම්බන්ධයෙන් අපේක්ෂිත බැරකම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිරීක්ෂණය |
|---|---|---|
| භාවිතා කරනු ලබන වාහන 03 ක් සභාවේ නමට අයිතිය මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | වාහනවල අයිතිය මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 3.5.2 නිෂ්කාර්ය වත්කම්

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාහන 03ක් වර්ෂ 3 සිට වර්ෂ 10ක් දක්වා භාවිතා කර නොතිබුණි. | වෙන්දේසි කිරීමට හා අනෙකුත් වාහන අලුත්වැඩියා කිරීමටත් කටයුතු කරමින් පවති. | වාහන භාවිතා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

---

### 4.1 අයවැය පාලනය

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් සහ තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක වෙනසක් නිරීක්ෂණය වීම, අයවැය සකස් කිරීමේ දුර්වලතායක් ලෙස අනාවරණය වි තිබුණි. | අළුත්වැඩියා වියදම් අඩු වීමත්, අවම වශයෙන් වූ වරෙන්තු බලපත්‍ර යොදවා ගැනීමත් නිසා අයවැය වියදම් හා සත්‍ය වියදම් අතර වෙනස්කම් නිරීක්ෂණය විය. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කළ යුතු වේ. |